**දැන්වීමයි**

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ**

**රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම**

1.0 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පවතින රියදුරු III වන ශ්‍රේණියේ පුරප්පාඩු 08 ක් පිරවීම සඳහා නිලධරයන් බඳවා ගැනීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක DSP/අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කො.ස./අනුමැති/V හා 2018.07.18 දිනැති අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ රියදුරු තනතුර සඳහා පුරප්පාඩු සංඛ්‍යාව 13 කි. පත්කරනු ලබන සංඛ්‍යාව, පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රියදුරු සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL 3- 2016 රු.25,790-10x270-10x300-10x330-12x350-38,990/-වේ. රු.28,490/-න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස්වීම ද රු.31,490/-න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස්වීම ද රු.34,790/- න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස්වීම ද ලබා ගත යුතුය. එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය. 2018.01.01 දිනට මූලික වැටුප රු.20,462/- සහ රු.4629/- ක ගැලපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

5.0 මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔවුන් යටත් විය යුතු වේ. තව ද, ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට නිලධාරීන් විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

6.0 මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරු වසර 03 ක කාලයක්වත් මෙම කොමිෂන් සභාවේ සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

7.0 **සුදුසුකම්** :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

(ඇ) පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර තුනක(03) කට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)

(ඉ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

(ඊ) වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.(පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.)

(උ) අවම උස අඩි 05 ක් විය යුතුය.

(ඌ) දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. (රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතුය.)

(එ) තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8.0 **වෘත්තීය පරීක්ෂණය** :

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේ දීම පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණයකදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රියදුරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ පරිපාටිය පහත වගුව පරිදි වේ.

| | **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| I. | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| II. | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 40 | 20 |
| III. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුම | 20 | 10 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද සහ අධ්‍යාපන සුදුසුකම් පිළිගත හැකි සහතික මඟින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

9.0 ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.0 ඉල්ලුම්පත්‍රය සෙ.මී.22-29 ප්‍රමාණයේ A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින් පැහැදිලිව ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ අයදුම්පත්‍රත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.

10.1 අයදුම්පත්‍ර බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "රියදුරු III වන ශ්‍රේණියට බඳවා ගැනීම" යන්න සඳහන් කරන්න.

10.2 මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2018.09.27** වේ.

11.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇත්තේ නම් පමණක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ මෙම නිවේදනය අනුව අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ.

12.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ
නියෝගය පරිදි,

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න
අධ්‍යක්ෂ ජනරාල්

2018. 08 ..........මස 21 ........ වන දින,

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
අංක 36
මලලසේකර මාවත
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ**
**රියදුරු III වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමඟ නම : ..........................................................................................
2. සම්පූර්ණ නම : ..........................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

4. ස්ථිර ලිපිනය : ..........................................................................................
5. රියදුරු බලපත්‍රයේ අංකය: ..........................................................................................
6. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
7. දුරකථන අංකය : ..........................................................................................
8. විවාහක/අවිවාහක බව : ..........................................................................................
9. උස : අඩි ............. අඟල් ...........
10. අධ්‍යාපන සුදුසුකම් :
    - අ.පො.ස.(සා.පෙළ)

පළමු වර ප්‍රතිඵලය වර්ෂය : විභාග අංකය :

| විෂයය | ප්‍රතිඵලය | විෂයය | ප්‍රතිඵලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

දෙවන වර ප්‍රතිඵලය වර්ෂය : විභාග අංකය :

| විෂයය | ප්‍රතිඵලය | විෂයය | ප්‍රතිඵලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

- අ.පො.ස.(උ.පෙළ)

වර්ෂය : විභාග අංකය :

| විෂයය | ප්‍රතිඵලය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෙනත් සුදුසුකම් :
    i. ..........................................................................................................
    ii. ..........................................................................................................
    iii. ..........................................................................................................

12. වෘත්තීය සුදුසුකම්:

..........................................................................................................

..........................................................................................................

13. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද:

..........................................................................................................

..........................................................................................................

14. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද
(ඔව් නම් විස්තර සඳහන් කරන්න) ..........................................................................

..........................................................................................................

..........................................................................................................

15. අයදුම්කරුගේ සහතිකය

අ. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ආ. ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

ඇ. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :

.................................................

අයදුම්කරුගේ අත්සන